# සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය

විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

වාරය : දෙවන වාරය

ඒකකය - වාක්‍ය නිර්මාණය

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.
නිපුණතා මට්ටම : 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

ඉගෙනුම් පල

- නාම  පදයේ හා ක්‍රියා පදයේ  වචන භේදය,පුරුෂ භේදය, ලිංග භේදය හා කාල භේදය අනුව වාක්‍ය නිර්මාණය කරයි.
- නිවැරදි වාක්‍ය රීති භාවිතයේ වැදගත්කම අගය කරයි.
- උක්තය, කර්මය, ආඛ්‍යාතය කෙරෙහි අවධානයෙන් යුතු ව වාක්‍ය නිර්මාණය කරයි.

## 1. පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු උක්ත පදය යොදන්න.

I .................... හොඳ ළමයෙක් වෙමි. **(මම/මා)**
II .................... වැඩසටහන මෙහෙයවයි. **(නිවේදකයකු/ නිවේදකයෙක්)**
III .................... මිහිරි ලෙස ගී ගයති. **(ගායිකාවෝ/ගායිකාවන්)**
IV .................... සතුරන්ට පහර දෙති. **(සෙබළුන් / සෙබළු)**
V .................... දිනපතා බුදුන් වඳින්නෙමු. **(අපි/ අප)**

## 2. පහත සඳහන් වාක්‍යවල කර්ම පදයට යටින් ඉරක් අඳින්න.

I ළමයි පොත් කියවති.
II ගොවියා ගවයන් දක්කයි.
III මව දරුවන් පෝෂණය කරන්නී ය.
IV සේනාවෝ සතුරන්ට පහර දෙති.
V ගස් සුළඟට සෙලවෙයි.

## 3. නිවැරදි පිළිතුර තෝරමු

I උත්තම පුරුෂ ඒක වචන නාම පදයක් වන්නේ,

**(අ)** අපි
**(ආ)** නුඹලා
**(ඇ)** මම
**(ඈ)** අම්මා

II ප්‍රථම පුරුෂ බහු වචන ක්‍රියා පදයක් වන්නේ ,

**(අ)** නැටුවා ය.
**(ආ)** නැටුවෝ ය.
**(ඇ)** නටයි.
**(ඈ)** නැටුවේ ය.

**III මධ්‍යම පුරුෂ බහු වචන අනුක්ත නාම පදයක් වන්නේ,**

**(අ)** තොප
**(ආ)** නුඹ
**(ඇ)** තොපි
**(ඈ)** නුඹලා

**IV ප්‍රථම පුරුෂ අනුක්ත නාම පදයක් වන්නේ,**

**(අ)** මම
**(ආ)** ගොවියෝ
**(ඇ)** කාන්තාවක්
**(ඈ)** මනාලියක

**V උත්තම පුරුෂ බහු වචන උක්ත නාම පදයක් වන්නේ,**

**(අ)** මා
**(ආ)** අපි
**(ඇ)** නුඹලා
**(ඈ)** අප

**4. පහත වාක්‍ය සඳහා සුදුසු ක්‍රියා පදය තෝරා යා කරන්න.**

| අ | ආ |
|---|---|
| තාරකාවෝ | සෙලවෙයි |
| ගස්හු | බබළයි |
| ගස් | බසිති |
| ගංගාවෝ ගලා | සෙලවෙති |
| තාරකා | බබළති |

**5.**

**I. දී ඇති ක්‍රියා පද පුරුෂ භේදය අනුව වර්ග කරන්න.**

**(බලයි, බලමි, බලන්නෙහි, බලමු, බලති, බලන්නෙහු)**

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|
| | | |
| | | |
| | | |

**II. එම එක් එක් ක්‍රියා පදය යොදා වාක්‍ය හයක් නිර්මාණය කරන්න.**

**වාක්‍ය නිර්මාණය**

**පිළිතුරු පත්‍රය**

**1.**

I. මම
II. නිවේදකයෙක්
III. ගායිකාවෝ
IV. සෙබළු
V. අපි

**2.**

I. ළමයි <u>පොත්</u> කියවති.
II. ගොවියා <u>ගවයන්</u> දක්කයි.
III. මව <u>දරුවන්</u> පෝෂණය කරන්නී ය.
IV. සේනාවෝ <u>සතුරන්ට</u> පහර දෙති.
V. ගස් <u>සුළඟට</u> සෙලවෙයි.

**3.**

I. (ඇ) මම
II. (ආ) නැටුවෝ ය.
III. (අ) තොප
IV. (ඇ) මනාලියක
V. (ආ) අපි

**4.**

| අ | ආ |
|---|---|
| තාරකාවෝ | සෙලවෙයි |
| ගස්හු | බබළයි |
| ගස් | බසිති |
| ගංගාවෝ ගලා | සෙලවෙති |
| තාරකා | බබළති |



**5.**

**I.**

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|
| **බලමි** | බලන්නෙහි | බලයි |
| **බලමු** | බලන්නෙහු | බලති |

**II.** **එම එක් එක් ක්‍රියා පදය යොදා වාක්‍ය හයක් නිර්මාණය කළ තිබිය යුතු ය.**